**ග්‍රන්ථ විවේචන**

**ඓතිහාසික පර්යේෂණ ලිපි සරණිය, කර්තෘ: එන්. ඒ. විමලසේන, කර්තෘ ප්‍රකාශන, මහනුවර, 2020, මිල රු. 1850.**

**එෂාන් ඉමල්ක විජයරත්න**

ඉතිහාසය මගින් ප්‍රයත්න දරනුයේ අතීතය යළි ගොඩනැංවීමට ය. අනෙකුත් සමාජීයවිද්‍යා සමඟ සංසන්දනය කර බලන විට ඉතිහාස විෂය ඒවායෙන් වෙනස් වනුයේ, ඉතිහාස විමසුමෙහි වස්තුව (object of historical inquiry) තව දුරටත් නොපවතින්නක් වීමෙනි. අතීතය යනු සිදු වූ දේ ඒ ආකාරයෙන් ම දැක්වීම බව ලියෝපෝල්ඩ් වොන් රන්ක (Leopold Von Ranke) සඳහන් කරයි. එහෙත්, සිදු වූ සමස්තය එලෙසින් ම ගෙනහැර දැක්වීම පිළිබඳ දැනුම අසම්පූර්ණ ය. එම දැනුම ලැබෙන හෝ ලැබීමට නියමිත මූලාශ්‍රයවලට සීමා වේ. පැරණි විද්වත්තු "ධර්මාර්ථ කාම මෝක්ෂාණං මුපදේශ සමන්විතං පූර්ව වෘත්ත කථා යුක්ත මිතිහාසං ප්‍රචක්ෂ්‍යතෙ" යැයි, ධර්මය, අර්ථය, කාමය හා මෝක්ෂය යන මේවා ලබනු පිණිස වූ උපදේශයන්ගෙන් යුක්ත වූයේත්, ඉතිහාසය යි ලෙස නිර්වචනය කළෝ ය. එහෙත්, අද්‍යතන යුගයේ දී අතීත සිදුවීම් හා සංසිද්ධි ඇසුරෙන් ගොඩනඟනු ලබන දැනුම් පද්ධතියක් ලෙස ඉතිහාසයේ පවතින වටිනාකම අවධාරණය වී ඇත. අපරදිග ග්‍රීක ශිෂ්ටාචාරවාසීන් පවා ඉතිහාසය දුටුවේ දැනුම හා ප්‍රඥාව වර්ධනය කරන විෂයයක් ලෙස ය. ලාංකේය ඉතිහාසය ලිවීමේ අතීතය තුළ ප්‍රථමයෙන් සාම්ප්‍රදායික ඉතිහාස රචන සම්ප්‍රදායක් ආරම්භ වූයේ වංසකථා, අටුවා ආදිය පදනම් කරගනිමිනි. එහි සන්දර්භය තුළ විචල්‍යතා සිදුවනුයේ, පූර්ව යටත්විජිත යුගයේ හා යටත්විජිත යුගයේ ඉතිහාසකරණය තුළ ඇති වූ ප්‍රවණතාවන්හි ප්‍රතිඵල වශයෙනි. දහනම වන සියවසේ අගභාගයේ දී විල්හෙල්ම් ගයිගර්ගේ පාලි වංසකතා ආශ්‍රේය මාර්ග කරගත් අධ්‍යයන හරහා විද්‍යාත්මක පර්යේෂණයන්හි මූලාරම්භය සිදුවිය. විසිවන සියවස ලාංකේය ඉතිහාසකරණය තුළ බ්‍රිතාන්‍ය අනුභූතිවාදී ඉතිහාසකරණ ප්‍රවේශයක් ජී. සී. මෙන්ඩිස්ගේ අධ්‍යයන හරහා නිරූපණය විය. සාම්ප්‍රදායික හා විද්‍යාත්මක ඉතිහාසකරණය අතර, ඇති වූ ගැටුම 1930 දශකය තුළ මූලික ප්‍රවණතාවක් විය. ලංකාවේ මුල් පරපුරේ ඉතිහාසඥයන් ලෙස සැලකෙන පෝල් ඊ. පීරිස්, ඊ. ඩබ්ලිව්. අදිකාරම්, කොල්වින් ආර්. ද සිල්වා හා ජී. සී. මෙන්ඩිස් ආදීන් යුරෝපීය විශ්වවිද්‍යාල ඇසුරේ කළ පර්යේෂණ විෂයෙහි රාජකීය ආසියාතික සංගමයේ ලංකා ශාඛාව ප්‍රධාන සාකච්ඡා මධ්‍යස්ථානය බවට පත්විය.

නිදහසින් පසු ලාංකේය ඉතිහාස ශික්ෂණවේදීත්වය තුළ මුල් පරපුරේ ඉතිහාසඥයන්ගේ ආභාසය මත දෙවන පරපුරේ ඉතිහාසඥයන් කළ අධ්‍යයන තුළ නව ප්‍රවණතා රැසක් ඉස්මතු විය. කථා ක්‍රමයේ ඉතිහාසයෙන් විවරණ ක්‍රමයේ ඉතිහාසය වෙතට ඉතිහාසඥයන්ගේ අවධානය යොමුවීම විසිවන සියවසේ ලාංකේය ඉතිහාසකරණය තුළ දැකිය හැකි ප්‍රමුඛ ප්‍රවණතාවකි. නව ඉතිහාසය (New History) ලිවීමේ සම්ප්‍රදායෙන් හා නව මාක්ස්වාදී (Neo Marxist) ප්‍රවේශයකින් ඉතිහාසකරණයේ යෙදුණු මහාචාර්ය රණවීර ලෙස්ලි ගුණවර්ධන විකල්ප ඉතිහාසකරණ සම්ප්‍රදායක් හඳුන්වා දුන්නේය. එවැනි කීර්තිමත් ඉතිහාසඥයෙකුගේ පන්නරය ලැබූ ඉතිහාසඥයෙකු වන මහාචාර්ය එන්. ඒ. විමලසේනයන්ගේ ඓතිහාසික පර්යේෂණ සංග්‍රහය අයත් වන්නේ "නව ඉතිහාසය" ලිවීමේ සම්ප්‍රදායට

ය. ඉතිහාස ක්ෂේත්‍රයෙහි සංසිද්ධීන්ගේ විශේෂ වැදගත්කම මෙන් ම ඒවා නිරූපණය කරන ඓතිහාසික වෙනස්කම් නිරූපණය කරන ප්‍රයෝජනවත් අධ්‍යයනයක් ලෙස මෙම ලිපි එකතුව පෙන්වා දිය හැකි ය.

"ඓතිහාසික පර්යේෂණ ලිපි සරණිය" තුළ අන්තර්ගත වන ලිපි සිවු වැදෑරුම් තේමාවන් යටතේ ගොනු කළ ශාස්ත්‍රීය ලිපි එකොළහක එකතුවකි. එනම්,

1. පුරාතන හා මධ්‍යතන ලංකාවේ රාජත්වය හා පරිපාලනය
2. ලාංකේය නීතිය හා අධිකරණ ක්‍රමයේ ඉතිහාසය
3. පුරාතන හා මධ්‍යතන ලංකාවේ තාක්ෂණය
4. අර්ථ ක්‍රමය හා ආගමික සම්බන්ධතා යන තේමාවන් ය.

කතුවරයා විද්‍යාත්මක ශික්ෂණයක පිහිටා කළ මෙම අධ්‍යයනයේ වටිනාකම හඳුනාගැනීම සඳහා පර්යේෂණයේ න්‍යායාත්මක රාමුව, ක්‍රමවේදය, විධික්‍රමය හා අරමුණු හඳුනා ගත යුතු ය. ඊ. එච්. කාර්ගේ සුප්‍රකට ප්‍රකාශය වූයේ, "ඉතිහාසය හැදෑරීමට පෙර ඉතිහාසඥයා හඳුනා ගන්න" යන්න යි. අපගේ ප්‍රස්තුත ඉතිහාසඥයා භාවිත කරන ප්‍රාථමික හා ද්විතියික මූලාශ්‍රය ප්‍රමාණිකවාදී ඥානමීමංසාව උදෙසා අතිශය වැදගත් වේ. මූලාශ්‍රය විවේචනාත්මකව විශ්ලේෂණය කර හේතුඵල සම්බන්ධතාවකින් යුතුව ඓතිහාසික තත්ත්වයන් විශ්ලේෂණයට ලක් කර ඇති අයුරු ප්‍රශංසාර්හ ය.

ඉතිහාසය, ඉතිහාසඥයා හා ඉතිහාසකරණය අතර පවතින අන්‍යොන්‍ය බැඳීම මෙම පර්යේෂණ ලිපි සංග්‍රහය තුළින් මනාව නිරූපණය වේ. දේශපාලන, ආර්ථික හෝ සංස්කෘතික ඉතිහාසය අළලා රචිත ඒක විෂයීය ග්‍රන්ථ සුලබ ලෙස දක්නට ලැබුණත් මෙවැනි බහු විෂයීය පර්යේෂණ ලිපි එක් කතුවරයෙකු විසින් ප්‍රකාශයට පත් කළ කෘති දුර්ලභ බව පෙනේ. එසේ හෙයින් ඉතිහාසඥයන් හට එවැනි වූ පර්යේෂණ එක් තැනකට එකතු කරමින් සාර්ථක එකතුවක් සිදු කිරීම සඳහා මෙය හොඳ පූර්වාදර්ශයක් බව ද කිව යුතු ය. පුරාතන ලංකාවේ අපරාධය, විනිශ්චය සහ දණ්ඩනය වැනි තේමා ඔස්සේ වැඩිදුරටත් අධ්‍යයනයේ නිරතවන්නන්හට නව දැනුමක් ලබාදෙන ලිපි ලෙස "ශ්‍රී ලාංකේය සමාජයේ ප්‍රධාන අපරාධ සහ නීතිය", "පුරාතන ශ්‍රී ලංකාවේ නීති සකස්වීමට පාදක වූ නීති මූල", " උඩරට රාජධානියෙහි නීතිය සහ අධිකරණ ක්‍රමය" යන අධ්‍යයනයන් පෙන්වා දිය හැකි ය. "පැරණි ශ්‍රී ලංකාවේ වාරිමාර්ග තාක්ෂණය, බිසෝකොටුව" වැනි අධ්‍යයනයක දී කතුවරයා ප්‍රස්තුත තේමාවට අදාළ මූලාශ්‍රය සියුම් පරීක්ෂාවට ලක් කරමින් දකුණු ඉන්දියාව සහ ලංකාවේ වාරිමාර්ග තාක්ෂණය සංසන්දනයට ලක් කර දෙරට අතර ඉංජිනේරුවන් හුවමාරු වීමේ දී ඇති වන සංකීර්ණ ස්වභාවය මැනවින් විග්‍රහ කර තිබේ.

අර්ථක්‍රමය හා ආගමික සම්බන්ධතා යන තේමාවට අදාළව "මධ්‍යතන ශ්‍රී ලංකාවේ දේශපාලන කටයුතුවලට ඉන්දියානු සාගරයේ වෙළෙඳ රටාවෙහි බලපෑම", "ක්‍රි.ව. 14 වැනි ශතවර්ෂය දක්වා ශ්‍රී ලංකාව සහ දකුණු ඉන්දියාව අතර පැවති ආගමික සම්බන්ධතා", "පැරණි ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වූ නීතිරීති පද්ධතිය" වැනි ලිපි පළකර තිබේ. මේ සමස්තය තුළින් පෙනී යනුයේ, කතුවරයා ලාංකේය

ආගමික සම්බන්ධතා මෙන් ම අර්ථ ක්‍රමය හා බැඳුණු ජාත්‍යන්තරීකරණය යන සංකල්පය මතු කිරීමට වැඩි රුචිකත්වයක් දක්වා ඇති බවයි. මෙම අදහස දිගුවක් බවට පත් කරමින් කෘතිය පිළිබඳ විමසීමක යෙදෙන මහාචාර්ය චරිත හේරත් සඳහන් කරන කරුණක් කෙරෙහි අවධානය යොමු කිරීම වැදගත් වේ. එනම්, "මෙරට දේශපාලනයේ අදටත් පවතින ගැටලුකාරී කලාපයක් වන 'ඉන්දියානු සාගරය මත පදනම් වූ ආර්ථික කළමනාකරණය' පිළිබඳව වර්තමානයේ රාජ්‍යතාන්ත්‍රික මැදිහත්වීම් නිසි පරිදි ගොඩනගා ගැනීම සඳහා අවශ්‍ය කරන ඓතිහාසික තත්ත්වයන් යෝජනා කරන බව මාගේ මතය යි."

සමස්තයක් ලෙස මෙම කෘතියේ අන්තර්ගත කරුණු පිළිබඳ විමසීමේ දී පෙනී යනුයේ, දේශපාලන, ආර්ථික හා ආගමික ඉතිහාසය තුළ පැවති දැනුමෙහි හිස්තැන් පිරවීම සඳහා කතුවරයා දැරූ ප්‍රයත්නයක් ලෙස "ඓතිහාසික පර්යේෂණ ලිපි සරණිය" පෙන්වා දිය හැකි බවයි. ලාංකේය ඉතිහාසකරණය තුළ නියැළෙන විද්‍යාර්ථීන්ට අතිශය වැදගත් ආශ්‍රේය මාර්ග මෙමගින් ලබා දෙනු ඇත. දේශපාලන, ආර්ථික, හා ආගමික ඉතිහාසය තුළ පවතින නවමු තේමා ග්‍රහණය කර ගනිමින් ඒවා අතර පවතින අන්තර් සබඳතා මනා ලෙස විශ්ලේෂණය කිරීම කතුවරයාගේ අරමුණ වී ඇති බව පෙනේ. විශේෂයෙන් ම අර්ථ ක්‍රමය හා ආගමික සම්බන්ධතා පර්යේෂණයට බඳුන් කිරීමේ දී පෙර'පර දෙදිග ශ්‍රේෂ්ඨ ඉතිහාසඥයෙකු වූ රණවීර ලෙස්ලි ගුණවර්ධනගේ අධ්‍යයනයන් මගින් ලද න්‍යායාත්මක අන්තර් දෘෂ්ටිය විචක්ෂණශීලී ලෙස ග්‍රහණය කොට ගෙන තිබේ. මෙම පර්යේෂණ ලිපි එකොළහ සාමාන්‍ය පාඨකයා හට මෙන් ම ප්‍රමාණික විද්වතුන් හට ද එකසේ වැදගත් වන ලෙස රචනා කර තිබීම චිත්තාකර්ෂණීය වේ. ලංකා ඉතිහාසය තේමා කර ගනිමින් අලුත්ම පර්යේෂණයන්හි ප්‍රතිඵල එක්රැස් කරමින් සෑහෙන තරම් වූ පුළුල් පරාසයක තේමා මෙම කෘතිය මගින් අනාවරණය කර තිබේ. භාවිතෝපයෝගී විෂය ක්ෂේත්‍රයෙහි අතුල්‍ය වූ ඥානයක් ඇති කතුවරයා ප්‍රස්තුත විෂය ක්ෂේත්‍රයන්හි හසළ හසුරුම්කම් ඇත්තෙකු බව මෙම පර්යේෂණ ලිපි සංග්‍රහය කියවන්නෙකුට වටහා ගැනීම අපහසු නොවනු ඇත. අවසාන වශයෙන් මෙම පර්යේෂණ ලිපි සංග්‍රහය ඉතිහාසය, පුරාවිද්‍යාව, නීතිය මෙන් ම සමාජවිද්‍යාව වැනි විෂයයන් පිළිබඳ අධ්‍යයනයන්හි හා පර්යේෂණවල නිරත වන ශාස්ත්‍රවන්තයන් හට බෙහෙවින් ප්‍රයෝජනවත් සාරගර්භ පර්යේෂණ ලිපි සංග්‍රහයක් ලෙස පෙන්වා දිය හැකි ය.